# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1298/19 - 2003 ජූලි 22 වැනි අඟහරුවාදා - 2003.07.22

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී. 27/78 V.

**1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත**

**27 (1) වන වගන්තිය යටතේ වූ නියමය**

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 27 වන වගන්තියේ (1) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර තෘතීයික අධ්‍යාපන සහ පුහුණු කටයුතු අමාත්‍ය කබීර් හෂීම් වන මා විසින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත එකී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර මේ පනතේ කාර්ය සඳහා විශ්ව විද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු (මෙහි මින්මතු "අදාළ නියමය " යනුවෙන් හඳුන්වනු ලබන ) පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා සම්බන්ධ උද්දේශිත නියමයේ උපලේඛනය, මේ නියමය මගින් ඉංජිනේරු පීඨය සහ ඒ පීඨය සංයුක්ත වන්නා වූ අධ්‍යයන අංශ වෙනුවට මෙහි උපලේඛනයේ දක්වා ඇති පීඨය සහ අධ්‍යයන අංශ ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

කබීර් හෂීම්,
තෘතීයික අධ්‍යාපන සහ පුහුණු කටයුතු පිළිබඳ අමාත්‍ය.

2003 ජූලි මස 10 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

| *I වන තීරුව* | *II වන තීරුව* |
| --- | --- |
| ඉංජිනේරු පීඨය | රසායන ඉංජිනේරු අධ්‍යයන අංශය,<br>සිවිල් ඉංජිනේරු අධ්‍යයන අංශය,<br>පරිගණක ඉංජිනේරු අධ්‍යයන අංශය,<br>විදුලි සහ විද්‍යුත් ඉංජිනේරු අධ්‍යයන අංශය,<br>ගණිත ඉංජිනේරු අධ්‍යයන අංශය,<br>යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයන අංශය,<br>නිෂ්පාදන ඉංජිනේරු අධ්‍යයන අංශය,<br>කළමනාකරණ ඉංජිනේරු අධ්‍යයන අංශය. |


08-407/1

G 002943 - 635 (2003/07)